# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2117/29 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2018/121.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ඒ. එල්. විජේසුන්දර මයා, අංක 130බී, යාලගල පාර, හොරණ (2). එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය, අංක 130 බී, යාලගල පාර, හොරණ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඞ්, ලොට් 15, බ්ලොක් ''ඒ'', බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු පාසල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2018/121.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ඒ. එල්. විජේසුන්දර මයා, අංක 130බී, යාලගල පාර, හොරණ (2). එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය, අංක 130 බී, යාලගල පාර, හොරණ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ්, ලොට් 15, බ්ලොක් ''ඒ'', බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් ආයතනයේ 2011.06.01 සිට 2016.11.30 දක්වා සේවය කරන ලද ඒ. එල්. විජේසුන්දර මයා සහ එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය යන අයට ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා නොගෙවීම නිසා අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න'' පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 577

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.